# RESPECT
## WOMEN

# කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම

UN WOMEN


World Health Organization

# කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම



## සාරාංශය

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (VAW) පිරිමින් සහ ගැහැණුන් අතර අසමාන බල සම්බන්ධකම් සමග මුල්බැස තිබේ. මෙම සමාජභාවී අසමානතා නිර්මාණය වන්නේ සහ වැරගැන්වෙන්නේ පවුල්, ප්‍රජාවන්, සේවා ස්ථාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන තුළ වෙනස්කොට සලකන සමාජ සම්මතයන්, භාවිතාවන් මගිනි. සමාජභාවී අසමානතා ද ප්‍රචණ්ඩත්වය සහ ජාතිය, ජනවර්ගය, ලිංගික දිශානතිය, හැකියාවන්/ නොහැකියාවන් සහ පුරවැසි තත්වය වැනි වෙනත් ලක්ෂණ මත පදනම් වූ වෙනස්කොට සැලකීම සමග සම්බන්ධ වේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ප්‍රචණ්ඩත්වය ඇතිකරන හෝ පවත්වාගෙන යන පුළුල් පරිසරය සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉතා වැදගත්ය. ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ඔවුන්ගේ අරමුදල් හවුල්කරුවන් හට ප්‍රධාන මාර්ග හතරක් ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වාතාවරණය ශක්තිමත් කිරීම සඳහා කළ හැකි දේ ගැන මෙම ලේඛනය විසින් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම




කාන්තා සංවිධානවල ආයෝජනය කිරීම



ප්‍රතිපත්ති සහ නීති ක්‍රියාත්මක කිරීම



කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සම්පත් ලබාදීම



## දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම

ප්‍රතිඵලය: නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙතින් කතාකිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළාදැකීම වෙනුවෙන් දේශපාලනික කැපවීම නිර්මාණය කිරීම

**අරමුණ:** විවිධ මට්ටම්වල නායකයයෝ සහ ප්‍රතිපත්ති සම්පාදකයයෝ, විශේෂයෙන්ම, ජාතික, උප ජාතික සහ ප්‍රජා නායකයෝ, සමාජභාවී අසමානතා හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතා කරමින් එය හෙළාදකිති. එය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රබල ක්‍රියාමාර්ග ගනිති.

**තාර්කිකත්වය:** සමාජභාවී අසමානතාව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා දේශපාලන කැපවීම නිර්මාණය කිරීම RESPECT රාමුව ක්‍රියාත්මක කිරීමේ මූලික කාර්යයකි. උදාහරණයක් ලෙස, ජාතික සහ උප ජාතික නායකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් වෙතින් සහාය ලබාගැනීම මගින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය පෞද්ගලික ප්‍රශ්නයක් නොව මනව හිමිකම් උල්ලංඝනයක් සහ මහජන අවධානය යොමුවිය යුතු ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන තිබේ. කාන්තාවන් සවිබලගැන්වීම සමග සම්බන්ධ අධ්‍යාපනය, දේපළ සහ නායකත්වය වැනි සාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෙම සහාය වැදගත් වේ. සමාජභාවී සමානාත්මතාව ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමට දේශපාලන නායකයන් හට හැකිය. ඒ සම්බන්ධයෙන් වෙනත් අයගේ සහාය සහ ක්‍රියාකාරීත්වයන් ලබාගත හැකිය.

දේශපාලන කැපවීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් පද්ධතිමය වෙනසක් සිදුකිරීම සඳහා ඉතා වැදගත්ය. ඒ සඳහා නව නීති, ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීම හා තිරසර ලෙස ක්‍රියාත්මක කිරීම, මූල්‍ය සම්පත් වෙන්කිරීම අවශ්‍යය. වෙනත් බලපෑම් සහගත නායකයන් ඇතුළුව දේශපාලන නායකයන් හට වෙනස්කම් කිරීම හා ප්‍රචණ්ඩත්වය පිටුදැකීම පිළිබඳ කතාකිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වටා තිබෙන සමාජ සම්මතයන් වෙනස් කිරීමේ ක්‍රියාවලයේදී වැදගත් භූමිකාවක් ඉටුකළ හැකිය.[1]

### ෆීජි සිද්ධි අධ්‍යයනය

ෆීජී ආණ්ඩුව සියල්ලන් ඇතුළත් කරගන්නා, සමස්ත රජය සඳහාම වන කාන්තාවන් සහ ගැහැණු ළමයින් එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාතික සැලැස්මක් සංවර්ධනය කරගත් ලොව මුල්ම රටවල් අතරින් එකකි. මෙම පස් අවුරුදු (2020-2025) මූලෝපාය වෙනුවෙන් ඉහළ මට්ටමේ කැපවීමක් තිබුණි. එය ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි, වෙන් කරන ලද ඉහළ මට්ටමේ අයවැයක් තිබිණි. සාක්ෂි මත පදනම් වූ එළඹුමක් සහිත මෙම මූලෝපායට ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කෙටි, මධ්‍ය හා දීර්ඝකාලීන ක්‍රියාමාර්ග අයත් වේ.

**ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රධානතම සලකාබැලීම්:** පහත දැක්වෙන සලකාබැලීම් මගින් බලපෑම් සහගත නායකයන් සහ වෙනත් ප්‍රතිපත්ති සම්පාදකයන් අතර දේශපාලන කැපවීම නිර්මාණය කිරීමේ කටයුතුවලට උපකාර කළ හැකිය.

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| **ජාතික, උප ජාතික සහ ප්‍රාදේශීය ප්‍රජා නායකයන් සම්බන්ධ කරගැනීම** | • ජාතික, පළාත් සහ ප්‍රාදේශීය යන සෑම මට්ටමකම පාර්ශ්වකරුවන් අතර ප්‍රධාන බලපෑම් සහගත නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් ඉලක්ක කරන්න. විධිමත් මෙන්ම අවිධිමත් ප්‍රජා නායකත්ව ව්‍යුහයන් (ඡන්දයෙන් තෝරා පත්කරගත්, සම්ප්‍රදායික සහ ආගමික නායකයන්) සම්බන්ධ කරගැනීම විශේෂයෙන් ග්‍රාමීය ප්‍රජාවන්හිදී වැදගත් බව සාක්ෂි මගින් පෙන්නුම් කෙරේ.[2] |
| **ක්‍රියාකාරීත්වය සඳහා ආචාරධාර්මික හා ආර්ථික පසුබිම් සැකසීම** | • නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණයන් හා ගතිකයන් සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩිකිරීම සඳහා ප්‍රාදේශීය විශේෂඥයන් සමග ජාතික හා පළාත් සංදර්භයන්හිදී වැඩකරන්න. කාන්තාවන්ට, ඔවුන්ගේ ළමයින්ට, පවුල්වලට හා ප්‍රජාවන්ට සහ ජාතික ආර්ථිකයට ඇතිවන නිශේධනාත්මක සමාජ හා ආර්ථික බලපෑම් පිළිබඳ සාක්ෂි සහ එය ගෝලීය සාක්ෂි පදනම්වලට බලපාන ආකාරය එයට ඇතුළත්ය.[3]<br>• සදාචාරාත්මක හා ආර්ථික යන දෙපැත්තෙන්ම තර්ක කරන්න: සමාජභාවී අසමානත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු මානව හිමිකම් උල්ලංඝනයන් වේ. එසේම, ඒවා පවුල් යහපැවැත්මට හා ආර්ථික සංවර්ධනයට බාධාකාරීය. පණිවුඩය සන්නිවේදනය කරන ග්‍රාහකයන් සහ ජනමත නායකයන් ඉලක්ක කරන්න.<br>• මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීම නිසා සිදුවිය හැකි විශාල සමාජ හා ආර්ථික පිරිවැයට සාපේක්ෂව වළක්වාගැනීමේ පිරිවැය අඩු බව අවධාරණය කරන්න.[4] |

## යෝග්‍ය වාතාවරණය

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| **කාන්තා ව්‍යාපාරවලට සහ කාන්තාවන් නායකත්වය දෙන සිවිල් සමාජ සංවිධානවලට අරමුදල් සපයන්න. ඔවුන් සමග හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීම** | • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කෙරෙහි වැඩි අවධානයක අවශ්‍යතාව පෙන්වාදීම සඳහා ජාතික සහ උප ජාතික කාන්තා මූලික සංවිධානවලට සහාය සහ අරමුදල් ලබාදෙන්න. කාන්තා සංවිධානවලට උපකාර කිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය දේශපාලනික අධිෂ්ඨානය නිර්මාණය කළ හැකි බව සාක්ෂි මගින් පෙන්නුම් කරනු ලැබේ. මහජන සහාය ප්‍රදර්ශනය කිරීම හරහා නීති සම්පාදකයන්ගේ හා නිලධාරීන්ගේ සහාය එම ප්‍රයත්නයන් වෙනුවෙන් ලබාගත හැකිය.[5]<br>• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ උද්දේශන න්‍යාය පත්‍ර වෙනුවෙන් කාන්තා ව්‍යාපාර, කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාර සහ සිවිල් සමාජයේ වෙනත් කොටස් අතර සන්ධාන ගොඩනැගීමට ආධාර කරන්න. ප්‍රාදේශීය, කලාපීය සහ ගෝලීය මට්ටමෙන් පොදු පණිවුඩ බෙදාගැනීම ද එයට අයත් වේ. |
| **පක්ෂ අතර සහ රාජ්‍යයන් අතර ව්‍යුහයන්ගේ සහාය ලබාගැනීම** | • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් පක්ෂ අතර සහ රාජ්‍යයන් අතර ව්‍යුහයන්ගේ සහාය ලබාගන්න. සමාජභාවී අසමානතා සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලය සහිත දැනට පවත්නා රාජ්‍ය ව්‍යුහයන් සමග වැඩකරන්න. ඒවා ශක්තිමත් කරන්න. උදාහරණයක් ලෙස, සමාජභාවී අමාත්‍යාංශය සහ ව්‍යවස්ථාදායකය ඇතුළු රජයේ ආයතන සමග වැඩකිරීමෙන් ඒවා සමාජභාවය සම්බන්ධයෙන් වැඩිපුර ප්‍රතිචාරාත්මක තත්වයට පත්කළ හැකිය.[6]<br>• සමාජභාවී අමාත්‍යාංශවලට බොහෝවිට තිබෙන්නේ සීමිත දේශපාලනික බලපෑමකි. එසේම, ඒවායේ ධාරිතාව හා අයවැය ද අඩුය. වෙනත් අමාත්‍යාංශවල හවුල්කරුවන් සොයාගැනීමට හා හැකි අවස්ථාවලදී ධාරිතාවන් ශක්තිමත් කිරීමට ඒවා ප්‍රයෝජනවත් වේ.<br><br>**කාම්බෝජයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවෙනි ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2014 - 2018) සැලසුම් කරනු ලැබුවේ අධිකරණයේ, නඩු පවරන්නන්ගේ, ප්‍රාදේශීය අධිකාරීන්ගේ, පොලිසියේ හා සිවිල් සමාජයේ ආධාරයෙනි. අදාළ රාජ්‍ය අමාත්‍යාංශ, සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජය හා බේරුණු පුද්ගලයන් ද ඒ අතර වේ.** |
| **ජාතික හා අන්තර්ජාතික නීතිය සහ කැපවීම් සම්බන්ධ කරගැනීම** | • ජාතික හා කලාපීය සම්මුතීන්, ප්‍රකාශයන් හා යෝජනා සම්මතයන් සහ දැනට පවත්නා ජාතික නීති හා ප්‍රතිපත්ති ජාතික මට්ටමේ නීති හා ප්‍රතිපත්ති දිරිගැන්වීමේදී, වැඩිදියුණු කිරීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී පදනම ලෙස භාවිතා කරන්න.[7] තිරසර සංවර්ධන අරමුණ හා නීතිමය වශයෙන් බැඳීම් ඇතිකරන කලාපීය හා ජාත්‍යන්තර ගිවිසුම් සහ ලේඛන (CEDAW, Maputo Protocol, Belém do Pará සහ Instanbul Convention වැනි) ජාතික න්‍යායපත්‍ර හා ප්‍රතිපත්ති සැකසීමේදී වැදගත් වේ.<br>• එක්සත් ජාතීන් සහ වෙනත් බහුපාර්ශ්වීය හෝ කලාපීය සංසදයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නායකත්වය පෙන්වීම සඳහා ජාතික නායකයන් හට ලබාදිය හැකි අවස්ථා සොයාබලන්න. |
| **කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමුවීම වර්ධනය කරගැනීම** | • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පරිමාණය හා එහි තීව්‍රතාව ද ප්‍රතිඵල ද ලේඛනගත කිරීම සඳහා දත්ත එක්රැස් කරන්න. දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේදී ජාතික පාර්ශ්වකරුවන්ගේ හිමිකාරිත්වය හා උනන්දුව නිර්මාණය කිරීම සඳහා මාර්ග සෙවීම වැදගත් වේ.<br>• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව කතාකිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ නායකයන් හා ප්‍රසිද්ධ පුද්ගලයන් දිරිගන්වන්න. උදාහරණයක් ලෙස, උප සහරා කලාපයේ රාජ්‍ය නායක බිරියන් විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රචාරණ ක්‍රියාමාලා කීපයක් සිදුකර තිබේ.[8]<br>• ක්‍රීඩකයන්, ජනප්‍රිය පුද්ගලයේ වැනි වෙනත් ක්ෂේත්‍රවල ජනමත නායකයන් සම්බන්ධ කරගන්න.<br>• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහාය පිණිස ප්‍රකාශ සිදුකිරීමට නායකයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට වේදිකා සහ අවස්ථා සපයන්න.<br>• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය සමග වැඩකරන්න. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පවතින ප්‍රමාණය සහ එහි ප්‍රතිඵල ගැන දැනුවත්භාවය වර්ධනය කළ හැකිය. හානිකර සමාජභාවී සමාජ සම්මතයන් හා ඒකාකෘති වැරගැන්වීම වැළැක්විය හැකිය.[9]<br>• විනෝද අධ්‍යාපනික හා ඩිජිටල් තාක්ෂණයන් සතුව විශාල පිරිසක් වෙත ළඟාවීමේ හැකියාව තිබේ. එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම වර්ධනය කළ හැකිය. එහෙත්, එමගින් පමණක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කළ හැකි බවට සාක්ෂි නැත.[10] |

### සියරා ලියොන් සිද්ධි අධ්‍යයනය

සියරා ලියොන්හි සිවිල් සමාජ සංවිධාන ඉහළ පෙළේ ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධි කීපයක් මෙන්ම කලින් වසරේ ලිංගික ප්‍රහාර සිද්ධිවල තියුණු වැඩිවීමක් පෙන්වන දත්ත ද භාවිතා කරමින් රජයට ක්‍රියාත්මක වීම සඳහා බලපෑම් කරන ලදී. එයට රාජ්‍ය නායක බිරිය විසින් නායකත්වය දෙන ලද ප්‍රචාරණ ක්‍රියාමාලාවක් ද ඇතුළත් විය. 2019 පෙබරවාරියේදී, ජනාධිපතිවරයා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් හදිසි තත්වයක් ප්‍රකාශ කළේය. එමගින් ඔහුගේ රජයට හදිසි රෙගුලාසි හඳුන්වාදීමේ අවස්ථාව ලැබිණි. බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් අලුත් විධිවිධාන සහ වැරදිකරුවන්ට වඩා දැඩි දඬුවම් පැමිණවීම ඒ අතර වේ.

හදිසි තත්වය හේතුවෙන් රජයට ඉක්මණින් ක්‍රියාත්මක වන්නට හැකි විය. ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරෙහි ජාතික අවධානය යොමුකිරීමට හැකි විය. උසාවිවල නඩු ඉක්මන් කළ හැකි විය. එහෙත්, එයට ලැබුණු ප්‍රතිචාර මිශ්‍ර ඒවා විය. නීතිමය වෙනස්කම් කිරීම සඳහා හදිසි අවස්ථාව භාවිතා කිරීම ප්‍රශ්න කිරීමට ලක්විය. එයට ප්‍රතිචාර ලෙස රජය 2019 ජූනි මස හදිසි අවස්ථාව ඉවත් කළේය. 2012 ලිංගික අපරාධ පනතට පාර්ලිමේන්තුව හරහා සිදුකරන ලද සංශෝධන 2019 සැප්තැම්බර් මාසයේදී සම්මත කරන ලදී. දූෂණය සඳහා අවම දඬුවම වැඩිකිරීම, බලය පාවිච්චි කිරීම වැනි අලුත් වැරදි ඇතුළත් කිරීම වෙනස්කම් අතරට ඇතුළත් විය.

**මූලාශ්‍රය:** Martin, L.S. and Koroma (2020) Sierra Leone declared a state of emergency over sexual violence.
African Arguments.


### අමතර මූලාශ්‍ර

'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', Weldon, S.L. and Htun, M. in Gender & Development 21 (2). 2012. 1985 සිට 2005 දක්වා රටවල් 70ක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මෙම ඓතිහාසික විශ්ලේෂණය මගින් හෙළිදරව් වන පරිදි ප්‍රතිපත්තිමය වෙනස්කම් නිර්මාණය කිරීම සඳහා ඉවහල් වන ස්ථාවර සාධකය වන්නේ ස්ත්‍රීවාදී ක්‍රියාකාරීත්වයයි.

'Economic and Social Costs of Violence: Evidence Brief' What Works to Prevent VAWG Programme. 2020. මෙම සාක්ෂි සාරාංශය විසින් දේශපාලන නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සමග සංවාදය සඳහා ප්‍රයෝජනවත් මෙවලමක් සපයනු ලැබේ. පකිස්තානය, ඝානා සහ දකුණු සුඩානයේ ජාතික ආර්ථිකයන්ට හා සමාජයට කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බලපාන ආකාරය පිළිබඳ වැදගත් සොයාගැනීම් මෙමගින් ඉදිරිපත් කරනු ලැබේ.

'Estimating Macroeconomic Loss Due to Violence Against Women and Girls: A Policy Toolkit.' Raghavendra, S., Kim, K., Ashe, S., Chadha,M., Piiroinen, P.T. and Duvvury, N. Galway: NUI Galway. 2019. මෙම ප්‍රතිපත්ති මෙවලම් කට්ටලය විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙහි ඍජු හා වක්‍ර පිරිවැය ගණනය කිරීම සඳහා සරල මාර්ගෝපදේශයක් සපයනු ලැබේ. ප්‍රචණ්ඩත්වය ආර්ථික වර්ධනයට බලපාන ආකාරය පිරිවැය ඔස්සේ තක්සේරු කිරීම මගින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආර්ථික වර්ධනයට තිබෙන පිරිවැය විග්‍රහ කරන ආකාරයක් ද මෙවලම් කට්ටලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

Global Scoping of Advocacy and Funding for the Prevention of Violence Against Women and Girls. The Equality Institute (2019). කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සඳහා 2012-2017 අතර කාලයේදී ආධාර පිරිනමන්නන්ගේ සහ අරමුදල් සම්පාදන රටාවල සාරාංශයක් මෙම පත්‍රිකාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. උගත් පාඩම්, අවස්ථා, අඩුපාඩු, උද්දේශනය සහ අරමුදල් වෙනුවෙන් නිර්දේශ ද එහි ඉදිරිපත් කරනු ලැබේ.



## කාන්තා සංවිධාන වෙනුවෙන් ආයෝජනය කිරීම

**ප්‍රතිඵලය:** කාන්තා සංවිධාන වෙනුවෙන් ආයෝජනය කරන්න. සම්පත් සපයන්න. ඔවුන්ගේ කාර්යභාරය ශක්තිමත් කරන්න.

**අරමුණ:** කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ ව්‍යාපාර සතුව සමාජභාවී සමානතාව වෙනුවෙන් පෙනී සිටීම, නවෝත්පාදනීය හා ඵලදායී ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රම සහ ප්‍රතිචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්, ධාරිතාව සහ අවකාශය තිබේ. එසේම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් කාන්තාවන් සම්බන්ධයෙන් වගවිය යුතු තත්වයට පත්කළ හැකිය.

**තාර්කිකත්වය:** බේරුණු පුද්ගලයන්ට උපකාර කිරීමේදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන (WROs) සිටින්නේ ඉදිරියෙන්මය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේදී ඒවා විසින් ඵලදායී ආදර්ශයන් සඳහා නායකත්වය දී තිබේ. ප්‍රචණ්ඩත්ව මට්ටම් අඩුකර තිබෙන ප්‍රජා බලමුළුගැන්වීම් මූලෝපායන් සැලසුම් කිරීම, වඩා හොඳ යොමුකිරීමේ පද්ධති සහ විධිමත් සේවාවන් (උදා: කාන්තා පොලිස් ස්ථාන, පවුල් උසාවි) වෙනුවෙන් පෙනීසිටීම, අවිධිමත් සේවා සම්පාදනය (උදා: ආරක්ෂිත නවාතැන්, මනෝ සමාජ සහාය) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණය කිරීමට හා කාන්තාවන්ගේ ආරක්ෂාවට සහාය වීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම එයට ඇතුළත්ය.[11]

කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් සමාජ වෙනස වෙනුවෙන් පෙනීසිටීම සඳහා ප්‍රාදේශීයව නිර්මාණය කරගන්නා සහ කාන්තාවන්ට වගකියන සාමූහික කාන්තා ක්‍රියාකාරකම් සඳහා අවකාශ නිර්මාණය කරනු ලැබේ. ඔවුන් නීතිමය වෙනස්කම් වෙනුවෙන් ක්‍රියාත්මක වී තිබේ. ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් සිදුකරන ලද ප්‍රතිපත්ති උද්දේශනය සහ ඒවා පවත්වාගෙන යන කාන්තා අයිතිවාසිකම් සංවිධාන සියලු ආකාරවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා වන ජාතික නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවලදී වැදගත්ම සාධකය වූ බව සමීක්ෂණ මගින් ඔප්පු වී තිබේ.[12]

පුද්ගල මට්ටමේදී, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් කාන්තාවන්ට නායකත්ව හා තීරණ ගැනීමේ භූමිකාවන් සඳහා අවස්ථා නිර්මාණය කරයි. විශේෂයෙන්ම, සම්ප්‍රදායික දේශපාලන ව්‍යුහයන් විසින් කාන්තාවන් බැහැර කරන පසුබිම්වලදී එය වැදගත් වේ. එමගින් කාන්තාවන්ගේ දේශපාලනික සවිබලගැන්වීමට මාර්ගයක් සැකසේ. එය සමාජභාවී සමානාත්මතාව වර්ධනය කිරීමේලා වැදගත් වන එක් සාධකයකි.[13]

ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මූලෝපායික, තිරසර, ව්‍යුහාත්මක සහ පිරිවැය කාර්යක්ෂම සමාජ වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් ඉටුකරනු ලබන භූමිකාව කෙතරම් වැදගත් වුව ද, ඒවාට අරමුදල් සැපයෙන්නේ සැලකිය යුතු තරම් අඩුවෙනි. සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් කැපකර තිබෙන ආධාර අරමුදල් අතරින් ඔවුන්ට ලැබෙන්නේ 1.5%ක් පමණි.[14] කාන්තා ව්‍යාපාර විසින් නායකත්වය සැපයීම අඛණ්ඩව පැවතීම සඳහා සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ප්‍රමාණවත් අරමුදල් සැපයිය යුතුය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරනු ලබන සමීක්ෂණ, වැඩසටහන් සහ තීරණගැනීමේ කටයුතුවලදී ඔවුන්ට වැදගත් භූමිකාවක් අවශ්‍යය.

**ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්:** පහත දැක්වෙන ප්‍රමුඛ සලකාබැලීම් මගින් කාන්තා අයිතිවාසිකම් සංවිධාන වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා කැපවී සිටින සංවිධානවලට මාර්ගෝපදේශනය සැපයිය හැකිය.

| **මූලික සලකාබැලීම්** | **විස්තර** |
|---|---|
| **විවිධ කාන්තා හිමිකම් සංවිධානවලට උපකාර කිරීම** | • ප්‍රාදේශීය මට්ටමේ කුඩා, අවිධිමත් සංවිධානවල සිට උද්දේශනය හා වගවීම සම්බන්ධයෙන් ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටම්වල ක්‍රියාත්මක විශාල, ඉහළපෙළේ සංවිධාන දක්වා විවිධ කාන්තා අයිතිවාසිකම් සංවිධාන රැසකට සහාය වීම.<br>• කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමුකරන ඒවාට සහ තරුණ හා වැඩිහිටි කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන් හෝ ලිංගික හෝ වාර්ගික සුළුතරයන්ට අයත් කාන්තාවන් වැනි විශේෂිත කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩත්වය හා වෙනස්කම් කිරීමට එරෙහිව ක්‍රියාත්මක වන සංවිධානවලට අමතරව කාන්තා අයිතිවාසිකම් වඩා උසස් කිරීම සඳහා පුළුල් ලෙස ක්‍රියාත්මක වන කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම.[15] |

## යෝග්‍ය වාතාවරණය

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| **හොඳම අරමුදල් වර්ගය පරිස්සමෙන් සලකාබලන්න** | • කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ව්‍යාපාර හැදීම සඳහා, බලාපොරොත්තු නොවූ අවස්ථා හා තර්ජනවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ සංවිධානමය ධාරිතාව ගොඩනගාගැනීම සඳහාත්, වැඩසටහන් පුළුල් කිරීම සඳහාත්, තිරසර ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම සඳහාත් හොඳින්ම සහාය ලබාදෙන නම්‍යශීලී, මූලික හා දිගුකාලීන අරමුදල් සැපයීම.[16]<br>• උද්දේශනය සහ ජාලගතවීම, කෙටිකාලීන නවෝත්පාදනය, සමීක්ෂණ හා අධ්‍යාපනය, දිගුකාලීන මූලික සහාය ආදිය සඳහා නම්‍යශීලී අරමුදල් සැපයීම පිණිස විවිධ ප්‍රමාණවල කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම සඳහා අරමුදල් ස්වරූප පරාසයක් සලකා බැලීම.<br>• කාන්තා අරමුදල් වැනි විශේෂඥ අරමුදල් සපයන්නන් හරහා කුඩා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට අරමුදල් සැපයීමට සහාය වීම.[17] |
| **සෘජු අරමුදල් සැපයීමට වඩා අමතර සහාය සැපයීම** | • කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ ඔවුන්ගේ කාර්යය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර පිණිස අඛණ්ඩ, නම්‍යශීලී, දිගු කාලීන සහාය සැපයීම. තාක්ෂණික උපදෙස්, මූල්‍ය ආධාර සහ ඉගෙනීම බෙදා ගැනීමට ඇති අවස්ථා එයට ඇතුළත් වේ.<br>• අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සඳහා ධාරිතා ගොඩනැගීම සහ ජාතික සහ ප්‍රාදේශීය ආණ්ඩු ඇතුළුව දේශීයව සම්පත් බලමුළුගැන්වීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම<br>• න්‍යායපත්‍ර ගෝලීය සහ බහුපාර්ශ්වික අවකාශයන් වෙත ගෙන ඒම සඳහා ජාතික කාන්තා ව්‍යාපාර සමග වැඩකිරීම සහ ජාල සහ සන්ධාන පිහිටුවීමට සහ අදහස් පළකිරීම ශක්තිමත් කිරීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන සඳහා අවස්ථා සහ වේදිකා නිර්මාණය කිරීම. උදාහරණ ලෙස, ජාලගතවීම්වලට අරමුදල් සැපයීමෙන් සහ අවස්ථා සංවිධානය කිරීමෙන් ද, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විධිමත් රාජ්‍ය දූත පිරිස්වලට ඇතුළත් කිරීමෙන් ද එසේ කළ හැකිය.<br>• සාම ක්‍රියාවලීන් සහ තිරසාර මූල්‍ය ආධාර ඇතුළු කාර්යයන්හිදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන දේශපාලනික තීරණගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කරගැනීම සඳහා වන ස්ත්‍රීවාදී න්‍යාය පත්‍ර සඳහා ජාත්‍යන්තරව සහ දේශීයව පෙනීසිටීම.[18]<br>• බහුවිධ අවාසි සහගත තත්වයන්ට මුහුණ දෙන කාන්තාවන් නියෝජනය කරන කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට අරමුදල් ලබාගැනීමේ පහසුව හා ඇතුළත්කාරීබව නිර්මාණය කිරීම සඳහා ඔවුන් ප්‍රගාමී ලෙස සම්බන්ධ කරගැනීම.[19] |
| **කාන්තා අයිතිවාසිකම් සංවිධානවල ආරක්ෂාව හා ස්වාධීනත්වය සඳහා උපකාර කිරීම**[20] | • කාන්තා මානව හිමිකම් ආරක්ෂකයන් (WHRDs) හඳුනා ගැනීම සහ සහාය දීම. ඔවුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ලේඛනගත කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිපත්ති සංවාදයේ සහ පුළුල් රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නවල කොටසක් ලෙස මෙය මතු කිරීම එයට ඇතුළත්ය.[21] |
| **කාන්තා අයිතිවාසිකම් සංවිධාන දැනට කරන කටයුතු මත පදනම්ව ඉදිරියට කටයුතු කිරීම** | • තම ප්‍රජාවන් සහ සංදර්භයන් පිළිබඳ කාන්තා අයිතිවාසිකම් සංවිධානවල ගැඹුරු දැනුම පිළිගැනීම හා ඇගයීම.<br>• ඔවුන්ගේ කාර්යයන්, ඉගෙනීම සහ බලපෑම් ලේඛනගත කිරීමට සහ බෙදා ගැනීම උදෙසා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට උපකාර කිරීම. උදා: අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමු, සමීක්ෂණ ආරම්භ කිරීම සහ ප්‍රායෝගිකත්වය පදනම් වූ ඉගෙනුම් ලේඛනගත කිරීම.[22]<br>• කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග එක්ව හවුල්කාරීත්වයන්, ඔවුන් උත්ප්‍රේරණය කිරීමට උත්සාහ කරන ව්‍යුහාත්මක වෙනස්කම් නිරීක්ෂණය කරන වාර්තාකරණ පද්ධති සහ මෙම වෙනස නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට සරල, නිර්මාණශීලී සහ කාර්යක්ෂම පියවරයන්ට අවස්ථාව සංවර්ධනය කිරීම.[23] |
| **ශක්තිමත් හවුල්කාරීත්වයන් ගොඩනැගීම** | • අරමුදල් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීමේ විශේෂඥයන් ලෙස ලෙස කාන්තා අයිතිවාසිකම් සංවිධාන සම්බන්ධ කරගන්න. ඔවුන් අරමුදල් මණ්ඩලවලට ඇතුළත් කිරීම තහවුරු කරන්න.<br>• වැඩසටහන් අයවැය පාලනය කිරීම, තීරණ ගැනීමේදී අදහස් දැක්වීමේ අවස්ථාව සහ සියලූ මට්ටම්වල තොරතුරු ලබාගැනීමේ හැකියාව වෙනුවෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමග සම හවුල්කාරීත්වය දිරිගන්වන්න.<br>• සාමූහික හඬ සහ බලපෑම ශක්තිමත් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ වෙනත් සමාජ ව්‍යාපාර අතර සන්ධාන ගොඩනැගීම සඳහා අරමුදල් සහ ආධාර සපයන්න. |

## සිද්ධි අධ්‍යයනය: Raising Voices සහ උගන්ඩාවේ CEDOVIP

Irish Aid iy Raising Voices සහ උගන්ඩාවේ CEDOVIP අතර දිගුකාලීන සහ නම්‍යශීලී හවුල්කාරිත්වය යනු අරමුදල් සපයන්නන් හා කාන්තා අයිතිවාසිකම් සංවිධාන අතර සම්බන්ධතා එම සංවිධාන වර්ධනය වන විට හා දේශීය අරමුදල් හා සහාය මූලාශ්‍රයන් සොයාගන්නා විට කාලයත් සමග පරිණාමය වන ආකාරය පිළිබඳ යහභාවිතාවන් සඳහා උදාහරණයකි.

Raising Voices යනු උගන්ඩාව පදනම් කරගත් කාන්තා අයිතිවාසිකම් සංවිධානයකි. එය සමාජ සම්මතයන් වෙනස් කිරීමට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩු කිරීමට ප්‍රජා පාදක ප්‍රවේශයන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරයි. එහි හවුල්කරු වන්නේ 2003 දී Raising Voices විසින් සම දායකත්වයෙන් ආරම්භ කරන ලද ස්වාධීන උගන්ඩා රාජ්‍ය නොවන සංවිධානයක් වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මධ්‍යස්ථානය (CEDOVIP) ය.

Irish Aid මුලදී උගන්ඩාවේ අයර්ලන්ත තානාපති කාර්යාලය හරහා Raising Voices සඳහා අරමුදල් සැපයූ අතර මෙම සහයෝගය Raising Voices සංවිධානයට එහි ප්‍රමුඛතම ප්‍රජා බලමුළුගැන්වීමේ වැඩසටහනක් වන SASA! නිර්මාණය කරගැනීමට උපකාරී විය. එය 2012 දී, එක්සත් රාජධානියේ ඒකාබද්ධ අරමුදල් ඔස්සේ අහඹු පාලන අත්හදා බැලීමක් (RCT) හරහා සාර්ථක ප්‍රතිඵල සහ පරිමාණය ඉහළ නැංවීමේ හැකියාව පෙන්නුම් කළේය. Raising Voices විසින් විවිධ සංදර්භයන් තුළ භාවිතා කිරීම සඳහා ක්‍රමවේදය අනුවර්තනය කිරීමට පටන් ගත් අතර, එහි උපදේශනය සහ ඉගෙනීමේ උත්සාහයන් වැඩි කිරීමත් සමග Irish Aid සිය අරමුදල් තානාපති කාර්යාලයේ සිට මූලස්ථානය වෙත මාරු කිරීමට තීරණය කළේය. එසේම, ව්‍යාපෘති මත පදනම් වීමේ සිට නම්‍යශීලී, මූලික අරමුදල් වෙත ද මාරු කිරීමට තීරණය කළේය. Irish Aid විසින් අමතර මූල්‍ය නොවන සහාය ද පිරිනමන ලදී. Raising Voices නව හවුල්කරුවන් සහ අරමුදල් සපයන්නන් සමග සම්බන්ධ කිරීම සහ ඔවුන්ගේ ගෝලීය බලපෑමට පහසුකම් සැලසීම එයට ඇතුළත්ය.

Raising Voices එහි ක්‍රමවේදය උගන්ඩාවෙන් ඔබ්බට පුළුල් කරන විට, CEDOVIP උගන්ඩාහි ඔවුන්ගේ ව්‍යාපෘති කටයුතු කරගෙන ගියේය. ඔවුහු එක්ව උගන්ඩා රජය සමග හවුල්කාරිත්වයක් ඇති කර ගත්හ. මෙමගින් Irish Aid හට Raising Voices සහ CEDOVIP සමග එක්ව වසර දෙකක සංක්‍රාන්ති කාලපරිච්ඡේදයක් තුළ කටයුතු කිරීමට හැකි විය. එය සැලසුම් කරනු ලැබුවේ මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය රජය සහ අනෙකුත් පරිත්‍යාගශීලීන් සමග ඇති හවුල්කාරිත්වය තුළින් තිරසාර වනු ඇති බව සහතික කිරීම සඳහාය.

**මූලාශ්‍රය:** Esplen, E. (2016) Donor support to southern Women's Rights Organizations: OECD Findings.
OECD DAC Network on Gender Equality

## අමතර මූලාශ්‍ර

'Toward a Feminist Funding Ecosystem: A framework and practical guide' AWID Resourcing Feminist Movements Initiative. 2019. මෙම මාර්ගෝපදේශය අරමුදල් භාවිතයන් මගින් ස්ත්‍රීවාදී ව්‍යාපාරවලට වඩා හොඳින් සේවය ලබාදිය හැක්කේ කෙසේදැයි අධ්‍යයනය කරයි.

'Feminist Pocketbook' The Coalition of Feminist for Social Change (COFEM). 2017. This useful resource includes Tipsheet 4: Staying Accountable to Women and Girls and Tipsheet 10: Feminist Movement Building

'Donor support to southern women's rights organisation: OECD Key Findings' Esplen, E. 2016. දකුණුදිග කාන්තා අයිතිවාසිකම් සංවිධාන වෙත පරිත්‍යාගශීලීන්ගේ සහයෝගයේ ප්‍රවණතා සහ උපාය මාර්ග මෙම වාර්තාව මගින් ලේඛනගත කරනු ලැබේ. ආධාරවල ප්‍රමාණය සහ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා ආධාරකරුවන් සඳහා ප්‍රවේශයන්, ආකෘති සහ යාන්ත්‍රණයන් ද එමගින් හඳුනාගනු ලැබේ.

'Standing with the changemakers: lessons from supporting women's movement' Womankind Worldwide. 2017 මෙම වාර්තාව මගින් කාන්තා අයිතිවාසිකම් සංවිධානවල භූමිකාවන් සහ කාන්තා අයිතිවාසිකම් උසස්කිරීම සම්බන්ධ චලනයන් සහ ඒ වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාවට ලබාදිය හැකි සහාය අවධාරණය කරනු ලැබේ.

## නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

**ප්‍රතිඵලය:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන සහ ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශය ඇතුළු සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

**අරමුණ:** ආයතනවල සහ වගකීම් දරන්නන්ගේ ධාරිතාව සහ වගවීම වර්ධනය කිරීම ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා නීති[24] සහ ප්‍රතිපත්ති නිර්මාණය කර බලාත්මක කරනු ලැබේ.

**තාර්කිකත්වය:** ජාතික නීති යනු අයිතිවාසිකම් සහ මූලික නිදහස සහතික කිරීමේ පළමු පියවර බව Declaration on the Elimination of Violence Against Women, Belém do Pará සම්මුතිය Maputo Protocol සහ Instanbul Convention වැනි ජාත්‍යන්තර හා කලාපීය ලේඛනවල දැක්වේ. අයිතිවාසිකම් පිළිගැනීම, ආරක්ෂාව සහ ඒවා බලාත්මක කිරීම සඳහා නීති විසින් පදනම සපයනු ලැබේ. සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන රජයේ ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් ද කැපවීමේ වැදගත් ප්‍රකාශයක් විය හැකි අතර එමගින් ක්‍රියාකාරීත්වය සඳහා රාමුවක් සපයයි.

පසුගිය වසර 30 තුළ, ගෘහස්ථ හිංසනය විසඳීම සඳහා නීති හඳුන්වා දුන් රටවල් සංඛ්‍යාව 1990 දී බිංදුවට ආසන්නව සිට 2020 වන විට 155 දක්වා ඉහළ ගොස් තිබේ.[25] ගෘහස්ථ හිංසන සිද්ධි සම්බන්ධයෙන් නඩු පැවරීමේ හැකියාව, ආරක්ෂාව සලසන ලෙස නියෝග නිකුත් කිරීම සහ බේරුණු පුද්ගලයන් සඳහා වන සේවා සඳහා අයිතිවාසිකම් විස්තර කිරීම එයට අයත් වේ. සමහර අවස්ථාවල නොමිලේ සෞඛ්‍ය සේවා සහ නීති ආධාර  සපයනු ලැබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ලිංගික අපයෝජන, කාාන්තා ලිංගික අවයව විකෘති කිරීම, ගෘහස්ථ හිංසනය, ළමා විවාහ සහ බලහත්කාර අපරාධ බවට පත්කිරීමේ නීති ඇතුළුව වෙනත් විශේෂිත නීති මාලාවක් ද එයට ඇතුළත්ය.

උරුමය, ඉඩම් සහ දේපළ අයිතිවාසිකම්, විවාහක භාරකාරත්වය සහ දික්කසාදය ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කරන පුළුල් නීති කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් අඩු කිරීමට උපකාරී වන බවට සාක්ෂි මතුවෙමින් තිබේ. නිදසුනක් වශයෙන්, ඉන්දියාවේ ප්‍රාන්ත 16ක කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම් අනුව පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ උරුම අයිතිවාසිකම් සමාන කිරීමෙන් ඇතිවූ බලපෑම අධ්‍යයනයකින් තක්සේරු කරන ලදී. සංශෝධනවලින් පසුව විවාහ වූ කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය[26] අත්විඳීමට ඇති ඉඩකඩ අඩු බව සොයා ගන්නා ලදී. ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සහ පිරිමි සහකරුවන් මත කාන්තාවන්ගේ අනාගත ආර්ථික යැපීම අඩු කිරීම සඳහා ද්විතීයක අධ්‍යාපනය වෙත ප්‍රවේශය වැඩිකිරීමේ නීති හා ප්‍රතිපත්ති වැදගත් වේ. ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර ඇති පිරිමින් විසින් ශාරීරික සහ/හෝ ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට ඇති ඉඩකඩ අඩුය.[27]

කෙසේ වෙතත්, ආරක්ෂාව සහ ප්‍රතිචාරය සඳහා ශක්තිමත් නෛතික සහ ප්‍රතිපත්ති රාමු වැදගත් වන බව සඳහන් කළ යුතුය. එය යුක්තිය සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය පුළුල් කිරීමේ අත්‍යවශ්‍ය අංගයකි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති අපරාධකරුවන්ට බාධාවක් ලෙස ක්‍රියාත්මක වන බවට හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ මට්ටම අඩු කිරීමට ඉවහල් වන බවට සාක්ෂි නැත.[28] බොහෝ රටවල, ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු සැලකිය යුතු මට්ටමකින් පවතින අතර විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශවල නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන්නේ නැත. නීති සහ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන කැපවීම, ඒ වෙනුවෙන් කැපකරන ලද අයවැය, පුහුණු කාර්ය මණ්ඩල, සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාමාර්ග සහ සේවා සඳහා පුළුල් ප්‍රවේශය අවශ්‍ය වේ.[29]

**ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්:** ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින සහ ඒවාට සහාය දක්වන ජාතික ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා නීති සහ ප්‍රතිපත්තිවල සඵලතාවය වර්ධනය කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ අධීක්ෂණය කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු කිහිපයක් මෙසේය.[30]

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය | • කාන්තා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට, එයින් ආරක්ෂාව සැලසීමට, නඩු පැවරීමට, දඬුවම් කිරීමට සහ සහන සැලසීමට රාජ්‍යයන් විසින් 'සාධාරණ' ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය කරන ජාත්‍යන්තර නීතියේ යෝග්‍ය නිසි ප්‍රමිතියට රාජ්‍යයන් අනුකූල වන බවට සහතික වීම.<br>• ප්‍රචණ්ඩත්වය සරලව අපරාධයක් බවට පත් කිරීමෙන් ඔබ්බට විහිදෙමින්, සිවිල් පිළියම් සහ වැළැක්වීම, දැනුවත්භාවය නැංවීම, ආයතනික යාන්ත්‍රණ සහ බේරුණු පුද්ගලයන්ගේ අධිකරණ ආරක්ෂාව සම්බන්ධ නීති සම්පාදනය කිරීම සඳහා පුළුල් ව්‍යවස්ථාදායක ප්‍රවේශයක් අනුගමනය කරන්න. |

| මූලික සලකාබැලීම් | විස්තර |
| --- | --- |
| | • දිවි ගලවා ගත් අය, කාන්තා සංවිධාන සහ අදාළ සිවිල් සමාජ සංවිධාන, රජයේ දෙපාර්තමේන්තු සහ සේවා සපයන්නන්, ජාතික මානව හිමිකම් ආයතන, පොලිසිය, නීති වෘත්තිකයන්, සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, සමාජ සේවා, ජාතික සංඛ්‍යාලේඛන කාර්යාල, ආගමික සහ ප්‍රජා නායකයින් ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ගෙන් උපදෙස් ලබා ගන්න. |
| විධිවිධාන | • කාන්තාවන්ට එරෙහි හිංසනය එහි පුළුල්ම ආකාරයෙන් (ශාරීරික, ලිංගික, චිත්තවේගීය සහ ආර්ථික ප්‍රචණ්ඩත්වය ආවරණය කරමින්) සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව නිර්වචනය කරන්න. ඒ අනුව නීතිවල පහත සඳහන් විශේෂ විධිවිධාන අඩංගු විය යුතුය. ලිංගික හිරිහැර, පවුල තුළ සහ අන්තර් පුද්ගල සම්බන්ධතා තුළ විවිධ ආකාරයේ හිංසනයන් මෙන්ම විවිධ ආකාරයේ හිංසනයන් සඳහා විවිධ අවකාශයන් (උදා: පොදු අවකාශයන්, නිවාස, සේවා ස්ථාන, පාසල්, සයිබර් ප්‍රචණ්ඩත්වය) ආවරණය කිරීම.<br>• විවිධ කාන්තා කණ්ඩායම්වලට වෙනස්කම් නොකිරීමේ විධිවිධාන සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළත් කිරීමේ විධිවිධාන සහිතව සියලූම කාන්තාවන් හට සමාන ආරක්ෂාව සලස්වන්න.<br>• චාරිත්‍රානුකූල සහ/හෝ ආගමික නීති සහ අවිධිමත් සහ විධිමත් යුක්ති පද්ධතීන් අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. එම පටිපාටි දෙකම යටතේ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් එයට ඇතුළත් වේ. |
| ක්‍රියාත්මක කිරීම | • රජයේ (සහ සිවිල් සමාජයේ) විවිධ ක්‍රියාකාරීන් විසින් නීති සහ ප්‍රතිපත්ති පුළුල් සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හෝ උපාය මාර්ගයක් ස්ථාපිත කිරීම. කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණ නිර්මාණය කිරීම එයට ඇතුළත් වේ.<br>• නව නීති සහ ප්‍රතිපත්ති ව්‍යාප්ත කිරීමට සහ ප්‍රචලිත කිරීමට නිශ්චිත උපාය මාර්ගයක් සකස් කිරීම. සමාජභාවී අසමානතා සහ ප්‍රචණ්ඩත්වය පිළිගන්නා සමාජ සම්මතයන් මාරු කිරීම පටන් ගැනීමට සහ ක්‍රියාත්මක කිරීම යන දෙකටම මෙය වැදගත් වේ.<br>• ඉදිරිපෙළ වැළැක්වීමේ සහ ප්‍රතිචාර සේවා ඇතුළුව, නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අයවැයක් වෙන් කරන්න. උදාහරණයක් ලෙස, සමාජභාවයට ප්‍රතිචාර දක්වන අයවැය හරහා (සම්පත් වෙන්කිරීම සාරාංශය බලන්න)<br>• සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, පොලිසිය සහ අධිකරණ නිලධාරීන් ඇතුළු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන රාජකාරි කරන්නන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ පරිවර්තනයන් සිදුවන ආකාරය පිළිබඳ විශේෂිත හා අඛණ්ඩ පුහුණුව සහ ප්‍රොටෝකෝල ලබා දීමෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට සහ සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට ආයතනික හැකියාව ගොඩනැගීම. මෙය ඵලදායී වීමට නම්, සමාජභාවී සමානාත්මතාව, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ හානිකර ආකල්ප සහ සම්මතයන් කෙරෙහි පුහුණුවේ අවධානය යොමු කළ යුතුය. දැනුම අලුත් කිරීමේ පුහුණුව සහ සේවය අතරතුර උපදේශනය ද වැදගත් වේ.<br>• බේරුණු පුද්ගලයන්ට විවිධ අංශ (උදා: සෞඛ්‍ය, ආරක්ෂක, නීති, සමාජ සේවා) විසින් සපයනු ලබන සම්බන්ධීකරණය කරන ලද සත්කාර සහ සහාය සේවා වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කරන්න. ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන්ට තොරතුරු සහ සහාය සැපයීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක දුරකථන උපකාරක සේවා සහ ආරක්ෂිත නිවාස පහසුකම් ලබාගැනීමේ හැකියාව ද වැදගත් වේ.<br>• නීති ආධාර, විශේෂිත උසාවි හෝ පටිපාටි ඔස්සේ, විශේෂයෙන් පුහුණු වූ විනිසුරුවරුන් සහිත උසාවි සහ වෙනත් යාන්ත්‍රණයන් ආදිය හරහා බේරුණු පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන යුක්තිය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම. |
| අධීක්ෂණය | • පැහැදිලි ප්‍රතිඵල, දර්ශක සහ පසුකළ යුතු මංසළකුණු සහිත නව නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණ සහ වගවීමේ රාමුවක් සකස් කිරීම.<br>• ආයතනික යාන්ත්‍රණ හරහා නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම. උදාහරණයක් ලෙස, බහු-ආංශික කාර්ය සාධක බලකායන්, කමිටු, ජාතික වාර්තාකරුවන් හෝ නිරීක්ෂණාගාර පිහිටුවීම මගින්.<br>• වාර්තා කිරීමේ සෙවණැලි යාන්ත්‍රණයන් පිහිටුවීමට සිවිල් සමාජ ක්‍රියාකරුවන් සහ කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට හැකිය. ප්‍රගතිය අධීක්ෂණය කර, වැඩිදුර වෙනස්කම් සඳහා උද්දේශනය කළ හැකිය. |

### රටක උදාහරණයක්: බ්‍රසීලය

බ්‍රසීලයේ Maria de Penha Law නීතිය ඓතිහාසිකය. සැමියාගේ ප්‍රහාරයකින් දෙපා පණ නැති තත්වයකට පත්වූ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියකගේ නමින් එය නම්කර තිබේ. 2006 දී පණවන ලද එම නීතිය කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනයට එරෙහිව සටන් කරන පළමු බ්‍රසීලියානු ෆෙඩරල් නීතිය විය. එමගින් ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩත්වයේ ආකාර නිර්වචනය කරන අතර 60,000 කට වැඩි ජනගහනයක් සිටින නගරවල ගෘහස්ථ හා පවුල් ප්‍රචණ්ඩත්වය සඳහා දැඩි දඬුවම් පැණවීමේ බලය සහිත විශේෂ උසාවි, කාන්තා පොලිස් ස්ථාන සහ කාන්තාවන් සඳහා පැය 24 පුරා ආරක්ෂිත නිවාස ඇතුළු වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ මාලාවක් නිර්මාණය කර ඇත. නීතිය ක්‍රියාත්මක වන්නේ කොහිදීද සහ කෙසේද යන්න සොයා බැලීම සඳහා කාන්තාවන්ගේ නායකත්වයෙන් නිරීක්ෂණාගාරයක් ද[31] ස්ථාපිත කරන ලදී. සමීක්ෂණ මගින් පෙන්නුම් කරන පරිදි සියලුම බ්‍රසීලියානුවන් පාහේ (98%) මෙම නීතිය ගැන අසා තිබේ. බොහෝදෙනාට (66%) එහි අරමුණ සහ ක්‍රියාකාරිත්වය හුරුපුරුදුය.[32] කෙසේ වෙතත්, කායික ප්‍රචණ්ඩත්වයේ වැඩිවීමක් සහිත මිශ්‍ර ප්‍රතිචාර වාර්තා විය., දැනුවත් කිරීම සහ වාර්තා කිරීම වැඩි වීම නිසා ද මෙය සිදුවිය හැකිය.[33] වඩා මෑත කාලයේ 2015දී, බ්‍රසීලය විසින් සමාජභාවය සමග සම්බන්ධව කාන්තාවන් ඝාතනය කිරීම පැහැදිලිව නිර්වචනය කිරීමට සහ වැරදිකරුවන්ට වසර 30 දක්වා සාපරාධී දඬුවම් වැඩි කිරීමට ස්ත්‍රී ඝාතන නීතියක් සම්මත කළේය.

### අමතර මූලාශ

Handbook for Legislation on Violence against Women: United Nations Division for the Advancement of Women in the Department of Economic and Social Affairs (DESA/DAW). 2010 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, අපරාධකරුවන්ට දඬුවම් කිරීම සහ බේරුණු පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන නීති සම්මත කර ගැනීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා සවිස්තරාත්මක මග පෙන්වීමක් සපයයි.

Protecting Women from Violence - Bridging the Implementation Gap Between Law and Practice: Global Indicators Group. 2019. Women, Business and the Law දත්ත කට්ටලය මත පදනම්ව, නීති ක්‍රියාත්මක කිරීමේදී සහ කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමේදී පවතින අඩුපාඩු මෙම සාරාංශයෙන් හඳුනාගනු ලැබේ.

Do our Laws Promote Gender Equality? A Handbook for CEDAW-based Legal Reviews: CEDAW. 2012. මෙම අත්පොත ජාතික නීති CEDAW සමග අනුකූල වීම තක්සේරු කිරීම සඳහා රාමුවක් ඉදිරිපත් කරයි. මූලික වශයෙන් අග්නිදිග ආසියාවේ වෘත්තිකයන් සඳහා ඉලක්ක කර ඇතත්, එය වෙනත් කලාපවල ද භාවිතා කළ හැකිය.

Women, Business and the Law. The World Bank. මෙම වාර්ෂික වාර්තා මගින් කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීම ඇතුළු දර්ශක පරාසයක් ආවරණය කරමින් රටවල් 173 කින් සංසන්දනාත්මක ගෝලීය නිරීක්ෂණ දත්ත සපයයි.

Virtual Knowledge Centre legislation module. UN Women. ජාතික නීති කෙටුම්පත් කිරීම, ඒවා වෙනුවෙන් පෙනී සිටීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ උපදෙස් සපයයි.

VAWG Resource Guide: Citizen Security, Law and Justice Brief: The World Bank. 2015. මෙම සාරාංශය විසින් පුරවැසි ආරක්ෂාව, නීතිය සහ යුක්තිය සමග කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගනී.

## සම්පත් වෙන්කරන්න


**ප්‍රතිඵලය:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වැඩසටහන්, පර්යේෂණ සහ ආයතන ශක්තිමත් කිරීම සඳහා සහ සෞඛ්‍යය, අධ්‍යාපනය, නීතිය ක්‍රියාත්මක කිරීමේ සහ සමාජ සේවා අංශවල හැකියාවන් වර්ධනය කිරීම සඳහා සම්පත් වෙන් කිරීම.

**අරමුණ:** කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම සඳහා ඵලදායී මැදිහත්වීම් සිදුකිරීම සඳහා පර්යේෂණ, නවෝත්පාදන, වැඩසටහන් සහ සේවා සඳහා වැඩියෙන් සහ තිරසාර ලෙස ආයෝජනය කිරීම.

**තාර්කිකත්වය:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජාතික සහ පළාත් පාලන ආයතන විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා කැප වූ මූල්‍ය හා මානව සම්පත් ආයෝජනය කිරීම අවශ්‍ය වේ. නිශ්චිත වැළැක්වීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ දත්ත රැස් කිරීම, නීතිමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා සහ රජයේ ආයතන, සේවා සහ සිවිල් සමාජ හවුල්කරුවන්ගේ දිගුකාලීන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා අරමුදල් අවශ්‍ය වේ. පහත දැක්වෙන අංශ හා පද්ධති තුළදී ද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ප්‍රමුඛතාව හා සම්පත් ලබාදිය යුතුය. සෞඛ්‍යය, අධ්‍යාපනය, නීතිය බලාත්මක කිරීම සහ සමාජ සේවා අංශ ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී අනෙකුත් අංශ සහ පද්ධති හරහා එසේ කළ යුතුය. ආයතනවල සමාජභාවී පදනමින් සිදුවන වෙනස්කොට සැලකීම් විසඳීමට සහ ආයතනික ධාරිතාව ගොඩනැගීමට සම්පත් වෙන් කිරීම ද සක්‍රිය පරිසරය ශක්තිමත් කිරීම සඳහා ඉතා වැදගත් වේ.

ගෝලීය වශයෙන්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ආයෝජනවල වර්ධනයක් සිදුවී ඇත. කෙසේ වෙතත්, අරමුදල් බොහෝ විට අක්‍රමවත් වන අතර අභියෝග යේ පරිමාණයට නොගැලපෙන කුඩා පරිමාණ ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරයි. ජාතික මට්ටමේදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා වගකිව යුතු රජයේ අමාත්‍යාංශ සතුව බොහෝ විට තිබෙන්නේ කුඩාම අයවැයකි. එබැවින් බොහෝ දුරට අවධානය යොමු කර තිබෙන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර සේවා සඳහා මිස වැළැක්වීම සඳහා නොවේ. එබැවින් එමගින් සහාය ලැබෙන්නේ ප්‍රචණ්ඩත්වයට ලක්වී සිටින හෝ අවදානමට ලක්ව සිටින කාන්තාවන්ගෙන් සුළුතරයකට පමණි.[34]

වැළැක්වීමේ ඵලදායි ආකෘතීන් ඉහළ නැංවීමට සහ නව ප්‍රවේශයන් සහ මැදිහත්වීම් අලුතින් නිර්මාණය කිරීමට සහ සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීමේ අවශ්‍යතාවක් පවතී.




පසුගිය පස්වසර තුළදී, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 2.042ක් වෙන්කර ඇති බව තක්සේරු කර තිබේ. එය වසරකට ඩොලර් මිලියන 408කි. කෙසේ වෙතත් මෙය වාර්ෂික වාර්ෂික නිල සංවර්ධන සහායෙන් (ODA) 0.002%ට අඩුය.[35]

**ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ප්‍රමුඛ සලකාබැලීම්:** පහත දැක්වෙන්නේ ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ඔවුන්ගේ අරමුදල් සහකරුවන් සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සම්පත් වෙන්කිරීමේදී වැදගත් වන සලකාබැලීම් කීපයකි.[36]

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| මූලෝපායික හා සාක්ෂි මත පදනම් වූ එළඹුම | • නිශ්චිත වැළැක්වීමේ ඉලක්ක / ප්‍රතිඵල හඳුනාගෙන ඒවා සහ ඒවායේ සම්පත්වලට අදාළ ඇගවුම් සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග කීපයක් සලකා බලන්න. උදා:<br>» කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්පත් කරගැනීම සඳහා පවතින අවස්ථා සහ පිවිසුම් ස්ථාන හඳුනා ගැනීම. උදා: කලාපීය මුලපිරීම්, නව හවුල්කාරිත්වයන්, සමාජ පරිවර්තන, සේවා විමධ්‍යගත කිරීම.<br>» ඔබගේ ජාතික සන්දර්භය තුළ දැනටමත් පරීක්ෂා කර, ඵලදායී බව ඔප්පු කර ඇති මැදිහත්වීම් පුළුල් කිරීම සලකා බලන්න. මැදිහත්වීම් වඩා හොඳින් අනුවර්තනය කර පුළුල් කරගන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සඳහා වැඩසටහන් නිර්මාණකරුවන්, ක්‍රියාත්මක කරන්නන් සහ පර්යේෂකයන් සමග සාකච්ඡා කරන්න. |

| මූලික සලකාබැලීම් | විස්තර |
|---|---|
| | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් පුළුල් කරන ආකාරය පිළිබඳ උපදෙස් Community for Understanding Scale Up (CUSP) සහ ALiGN platform වෙතින් ලබාගත හැකිය.<br>» ඔබගේ ජාතික හෝ ප්‍රාදේශීය සන්දර්භයන් තුළ ක්‍රියාත්මක කිරීමෙන් ඵලදායී බව ඔප්පු වූ වැළැක්වීමේ ප්‍රවේශයන් අනුරූප කරගැනීම සලකා බලන්න. මේ සඳහා වැළැක්වීමේ තාක්ෂණික විශේෂඥතාව සහ ශක්තිමත් සන්දර්භීය දැනුම යන දෙකම අවශ්‍ය වේ.<br>» සාක්ෂි මත පදනම් වූ මුලපිරුම් අනුරූප කරගැනීම පිළිබඳ උපදෙස් What Works to Prevent VAWG වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.[37]<br>» අඩු සම්පත් ප්‍රමාණයකින් වැඩි බලපෑමක් ඇති කිරීමට තිබෙන අවස්ථා හඳුනා ගැනීම. උදාහරණයක් ලෙස දැනට කරගෙන යන මුලපිරීම් සඳහා එළඹුම් ඒකාබද්ධ කිරීම හෝ අංශ තුළ සහ අංශ හරහා වැඩ කිරීම. |
| **සම්පත් සැලසුම් කිරීම** | • වැළැක්වීමේ මැදිහත්වීමක් සඳහා අවශ්‍ය නිශ්චිත යෙදවුම් හඳුනා ගන්න. උදා: ස්ථාවර වියදම් (එනම්, ගොඩනැගිලි, උපකරණ, වාහන), සංවර්ධන වියදම් (එනම්, පුහුණුව, අත්පොත්), සහ වඩාත් නම්‍යශීලි වියදම් (එනම්, කාර්ය මණ්ඩලය, සැපයුම්, වාහන/ගොඩනැගිලි නඩත්තු කිරීම)[38]<br>• විවිධ යෙදවුම්වල පිරිවැය ගණනය කරන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ විවිධ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේදී කෙතරම් වියදමක් යන්නේදැයි ගණනය කිරීමේදී guidelines for conducting cost analyses වෙතින් උපදෙස් ලබාගන්න. විවිධ සංදර්භයන්හිදී වැළැක්වීමේ වැඩසටහන්වලට යන පිරිවැය සන්සන්දනය කරන්න.<br>• අවශ්‍ය නම් වෙනත් මූලාශ්‍රවලින් සම්පත් බලමුළුගැන්වීම සඳහා සැලැස්මක් සකස් කිරීම. උදා: රාජ්‍ය/පෞද්ගලික හවුල්කාරිත්වයන්, පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග සහ ජාත්‍යන්තර ආධාරකරුවන්.[39]<br>• ආධාරකරුවන් වෙතින් අරමුදල් ලබාගැනීමට ඉලක්ක කරන්නේ නම්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ආයෝජනය කිරීමේ වැදගත්කම පෙන්වාදෙන්න. ප්‍රචණ්ඩත්වයේ ආර්ථික හා සමාජීය පිරිවැය අවධාරණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් කිහිපයක් පහත දැක්වේ (DFID-funded What Works study on the impact of VAW on national economies and society in Ghana, South Sudan and Pakistan. |
| **සම්පත් වෙන්කිරීම** | • බහු පාර්ශ්වකරුවන් සහභාගී වන වැළැක්වීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ ඒවායේ හිමිකාරිත්වය ගොඩනැගීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා බහුවාර්ෂික අරමුදල් චක්‍රයක් භාවිතා කරන්න. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සැලසුම් කිරීම, අනුරූප කරගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පාලන හා සම්බන්ධීකරණ ව්‍යුහයන් ක්‍රියාත්මක කරන්න.<br>• කාන්තා අයිතිවාසිකම් සංවිධාන හවුල්කරුවන් සහ ක්‍රියාත්මක කරන්නන් ලෙස සලකා අරමුදල් සපයන්න. කාන්තා අයිතිවාසිකම් සංවිධාන සඳහා සහාය වන්නේ සහ ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනගැනීමට මීට පෙර කොටස බලන්න.<br>• උපාය මාර්ග, මැදිහත්වීම් සහ සේවාවන් ඔබේ සන්දර්භයට අනුවර්තනය කරගැනීම, ඒවායේ කාර්යක්ෂමතාව මෙන්ම ඕනෑම අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් නිරීක්ෂණය කිරීම සහ වැළැක්වීමේ සාක්ෂි පදනම ගොඩනැගීම සඳහා ප්‍රමාණවත් පර්යේෂණ, නියාමනයන් සහ අධීක්ෂණය සඳහා සම්පත් යොදවන්න.<br>• වැඩසටහන් / ව්‍යාපෘති මට්ටමින්, දිගු කාලීන අරමුදල් සහතික කිරීම. උදාහරණයක් ලෙස, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් සඳහා වසර 1-2 කෙටිකාලීන ව්‍යාපෘති චක්‍ර සාර්ථක නොවන බවට සැලකිය යුතු තරම් සාක්ෂි තිබේ.[40] සංවර්ධනාත්මක පර්යේෂණ, මැදිහත්වීම් සැලසුම් / අනුවර්තනය සහ ධාරිතා සංවර්ධනය සඳහා කල් අවශ්‍ය වේ. ප්‍රමුඛ කාර්ය මණ්ඩලය ප්‍රවේශමෙන් තෝරා ගැනීමට සහ පුහුණු කිරීමටත්, අඛණ්ඩ සහාය සහ උපදේශනය සැපයීමටත් ප්‍රමාණවත් කාලය සහ අයවැය අවශ්‍යය.[41]<br>• මැදිහත්වීමක් අවසන් වූ පසු, තිරසාරභාවය සඳහා සැලසුම් කරන්න. වෙනස්කම් පවත්වා ගැනීම සඳහා අර්ථවත් නායකත්වය සහ ප්‍රජාවන් තුළ හිමිකාරිත්වය එයට අයත් වේ.[42] |
| **සම්පත් අධීක්ෂණය** | • අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු වෙත අරමුදල් ලැබෙන බව සහතික කිරීම සඳහා අරමුදල් බෙදාහැරීම් නිරීක්ෂණය කිරීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාකාරකම් උදෙසා වියදම් කිරීම.<br>• ආධාරකරුවන්ට, කාන්තා අයිතිවාසිකම් සංවිධාන / සිවිල් සමාජය අරමුදල් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කරන්නේදැයි තක්සේරු කිරීමේ හැකියාව ඇතිවන පරිදි සම්පත් භාවිතයේ විනිවිදභාවය තහවුරු කරන්න. ආයෝජනය අඩු වියදම් එකක් බවට පත්නොවී, පිරිවැයට සාපේක්ෂව දීර්ඝකාලීනව ඵලදායීද යන කරුණ කෙරෙහි අවධානය යොමුකරන්න. |

### රටක උදාහරණයක්: VicHealth, Australia[43]

ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා ප්‍රාන්තය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා සමස්ත රජයේ එළඹුමක් වර්ධනය කිරීමට නායකත්වය දී ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීමේ කාර්යය, National Plan to Prevent Violence aganst Women and their Children 2010-2022 සංවර්ධනය කිරීම සහ ඉන් අනතුරුව 'Change the Story' ජාතික වැළැක්වීමේ රාමුව (2015) මෙයට ඇතුළත් කර ඇත. පළාත්, ප්‍රාදේශීය සහ රාජ්‍ය මට්ටමින් නායකත්වය, පාලනය සහ සම්බන්ධීකරණය සඳහා ආයෝජනය කර තිබේ. දිගුකාලීන ක්‍රියාත්මක කිරීම් සහ පර්යේෂණ සඳහා කැපවූ අරමුදල් වෙන් කිරීම ද සිදු කර තිබේ. ANROWS (Australia's National Research Organisation for Women's Safety) නිර්මාණය කිරීම සහ ඒ සඳහා කැපවුණු OurWatch අරමුදලට ආයෝජනය කිරීම ඒ අතර තිබේ.

### රටක උදාහරණයක්: දකුණු අප්‍රිකාව[44]

2018 නොවැම්බරයේදී, දකුණු අප්‍රිකානු ජනාධිපති රැම්ෆෝසා විසින් National Gender-based Violence and Femicide Summit සහ ඉන් අනතුරුව National Strategic Plan කැඳවන ලදී. අයවැය ප්‍රමුඛතාවන් නැවත සැකසීම මත පදනම්ව, සැලැස්ම සඳහා රජය ZAR බිලියන 1.6 (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 92) වෙන්කරන ලදී. සැලැස්මේ දැක්වෙන වඩා පුළුල් ජාතික ප්‍රමුඛතා අනුව ආයෝජන පෙළගැස්වීම සඳහා පෞද්ගලික අංශය, සංවර්ධන හවුල්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් ලබාගත් දායකත්වයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බහුආංශික අරමුදලක් ද පිහිටුවන ලදී. සම්පත් වෙන් කිරීම ඇතුළු සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙහෙයවන මෙහෙයුම් කමිටුව ජනාධිපති කාර්යාලයේ පිහිටා ඇති අතර සිවිල් සමාජ සංවිධාන සහ රජය විසින් එහි සම සභාපතිත්වය දරනු ලැබේ. මෙම සැලැස්ම විසින් වැළැක්වීමේ වැඩසටහන් සඳහා සම්පත් වෙන්කරනු ලැබේ. එසේම, අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සිදුකරමින් සියලු වයස්, ස්ථාන, ආබාධිත, ලිංගික දිශානතිය, ලිංගිකභාවය සහ සමාජභාවය, ජාතිකත්වය සහ වෙනත් කාරණා සම්බන්ධ විවිධත්වයන් සහිත පුද්ගලයන්ට වඩා හොඳ ආරක්ෂාවක් ලබාදෙයි.

### අමතර මූලාශ

Handbook of National Action Plans on Violence against Women UN Women. 2012. අයවැය පිළිබඳ 3.6 පරිච්ඡේදය විවිධ රටවල සන්දර්භයන්හිදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කටයුතු සඳහා අරමුදල් සපයා ඇති ආකාරය පිළිබඳ උදාහරණ සපයයි.

Global scoping of advocacy and funding for the prevention of violence against women and girls Equality Institute. 2019. මෙම පරාසකරණ අධ්‍යයනය ජාත්‍යන්තර මට්ටමින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතු සඳහා ආධාර සපයන ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් රටා පිළිබඳ විශ්ලේෂණයක් සපයයි.

Guidelines for Conducting Cost Analyses of Interventions to Prevent Violence against Women and Girls in Low and Middle Income Settings. What Works to Prevent VAWG Programme. 2019. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් පිරිවැය සැකසීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයක් සපයයි. ඔබේ මැදිහත්වීම ලබාදීම සඳහා ඔබට අවශ්‍ය නිශ්චිත සම්පත් හඳුනාගැනීමට සහ මෙම සම්පත්වලට වටිනාකමක් ලබා දෙන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමට ඔබට උපකාර කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ සැලසුම් කර ඇත.

# පසු සටහන

[1] Alexander-Scott, M. Bell, E. and Holden, J. (2016) DFID Guidance Note: Shifting Social Norms to Tackle Violence Against Women and Girls (VAWG). London: VAWG Helpdesk

[2] Jewkes, R. et al. (2019) Community activism approaches to shift harmful gender attitudes, roles and social norms. Pretoria: What Works.

[3] ජාතික මට්ටමින් තත්ත්ව විශ්ලේෂණයක් සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩිදුර මග පෙන්වීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කළ ජාතික උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා වැඩපොතේ පියවර 1 බලන්න.

[4] Georgia, T. (2015) DFID Guidance Note on Addressing Violence Against Women and Girls (VAWG) Through DFID's Economic Development and Women's Economic Empowerment Programmes – Part B, London: VAWG Helpdesk; What Works to Prevent VAWG Programme (2020) 'Economic and Social Costs of Violence: Evidence Brief' Pretoria: What Works.

[5] Weldon, S.L. and Htun, M. (2012) 'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', in Gender & Development 21 (2).

[6] V4C Nigeria (2017) Thinking and Working Politically for Legal Reform on Gender Equality. Abuja: V4C

[7] Fraser, E and Wood, S (2018) VAWG Legislation, Helpdesk Research Report No. 156. London, UK: VAWG Helpdesk.

[8] E.g. in this one in West Africa; Gambia; Malawi; and Namibia

[9] See UN Women (2019) The Big Conversation. Handbook to Address Women against Women in and through the Media. Geneva.

[10] Kerr-Wilson, A.; Gibbs, A.; McAslan Fraser E.; Ramsoomar, L.; Parke, A.; Khuwaja, HMA.; and Rachel Jewkes (2020). A rigorous global evidence review of interventions to prevent violence against women and girls, What Works to prevent violence among women and girls global Programme, Pretoria, South Africa

[11] Bishop, K and McLean, L (2017) Ibid.

[12] Weldon, S.L. and Htun, M. (2012) 'Feminist mobilisation and progressive policy change: why governments take action to combat violence against women', in Gender & Development 21 (2).

[13]13 Womankind (2017) Standing with the changemakers: lessons from supporting women's movements. Womankind Worldwide.

[14] ActionAid (2020) Women's Rights Organizations Challenging Violence. ActionAid UK.

[15] Womankind Worldwide (2017) Ibid.

[16] Moosa, Z. and Daly, S. (2015) Ibid. ; Esplen, E. (2016) Ibid.

[17] Esplen, E. (2016) Ibid.

[18] AWID (2019) Ibid.

[19] Esplen, E. (2016) Ibid.

[20] Nagarajan, C and Fraser, E (2016) Supporting a healthy WRO/CSO sector working on VAWG (and related gender outcomes) at the national/ large sub-national level, VAWG Helpdesk Research Report No. 122. London, UK: VAWG Helpdesk.

[21] Womankind Worldwide (2017) Ibid.

[22] Esplen, E. (2016) Ibid.

[23] Esplen, E. (2016) Ibid.

[24] මෙයට නීති සහ ප්‍රතිපත්ති ඇතුළත් වේ. ඒවා නම්, ලිංගික අපයෝජන අපරාධයක් බවට පත්කිරීම, උරුමයේ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම, ළමා විවාහ සහ කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම තහනම් කිරීම, කාන්තාවන් සඳහා සමානාත්මතාවය සහතික කරන විවාහ, භාරකාරත්වය සහ දික්කසාද නීති, සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා ක්‍රියාකාරී සැලසුම්, අත්අඩංගුවට ගැනීමේ නියෝග සහ නීති ආධාර වැනි යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ සේවාවන් ක්‍රියාත්මක කිරීම ආදියයි.

[25] World Bank (2020) Women, Business and the Law 2020, Washington D.C.: World Bank.

[26] Amaral, Sofia (2017) "Do Improved Property Rights Decrease Violence Against Women in India?" Institute for Social and Economic Research. Available at SSRN: https://ssrn.com/abstract=2504579. For a summary see https://prevention-collaborative.org/wp-content/uploads/2018/11/Study-summary-Inheritance-India-FINAL.pdf

[27] Abramsky T, Watts C, Garcia Moreno C, et al. (2011) What factors are associated with recent intimate partner violence? Findings from the WHO multi-country study on women's health and domestic violence. Biomed Central Public Health; 11(109): 1-17.

[28] Heise, L. (2011) What Works to Prevent Partner Violence: An Evidence Overview.

[29] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජාතික නීති සහ ප්‍රතිපත්ති සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සවිස්තරාත්මක මගපෙන්වීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීති සම්පාදනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ අත්පොතෙහි සොයාගත හැකිය.

[30] ප්‍රධාන සම්පත් මංජුසාවේ අවධාරණය කරන ලද සාක්ෂි මත පදනම් වේ.

[31] Observatório Lei Maria da Penha (Maria de Penha observatory consortium - OBSERVE)

[32] Gattegno, M, Wilkins, J and Evans, D (2016) 'The relationship between the Maria de Penha Law and intimate partner violence in two Brazilian states', International Journal of Equity and Health, 15: 138.

[33] Gattegno, M, Wilkins, J and Evans, D (2016) Ibid.

[34] Equality Institute (2019) Global scoping of advocacy and funding for the prevention of violence against women and girls

[35] Equality Institute (2019) Ibid.

[36] Based on lessons from evidence highlighted in the Key Resources box

[37] Including VAW prevention curricula, a rigorous evidence review, and effective design and implementation elements in VAW interventions.

[38] The What Works to Prevent VAWG research programme has conducted the first ever substantial multi-country body of evidence on the impact and cost effectiveness of preventing VAW. The research found that staff costs make up a sizeable portion of costs in VAW prevention interventions and that type and intensity of interaction between staff and beneficiaries is therefore the key cost driver for VAW prevention. See: Torres-Rueda, S., Ferrari, G., Orangi, S., Hitimana, R., Daviaud, E., Tawaih, T., et al (2020) What will it cost to prevent violence against women and girls in low- and middle-income countries? Evidence from Ghana, Kenya, Pakistan, Rwanda, South Africa and Zambia, Health Policy and Planning, czaa024.

[39] For an overview of key donors, see the Equality Institute's (2019) Global scoping of advocacy and funding for the prevention of violence against women and girls

[40] What Works to Prevent VAWG global research programme / Equality Institute (2019)

[41] Jewkes, R., Willan, S., Heise, L., Washington, L., Shai, N., Kerr-Wilson, A, Christofides, N. (2020) Effective design and implementation elements in interventions to prevent violence against women and girls. What Works To Prevent VAWG? Global Programme Synthesis Product Series. South African Medical Research Council, Pretoria

[42] Goldmann, L., Lundgren, R., Welbourn, A., Gillespie, D., Bajenja, E., Muvhangom, L. & Michau, L. (2019) On the CUSP: the politics and prospects of scaling social norms change programming, Sexual and Reproductive Health Matters, 27:2, 51-63.

[43] See https://www.vichealth.vic.gov.au/-/media/ResourceCentre/PublicationsandResources/PVAW/Violence-Against-Women-Research-Overview.pdf

[44] Letter from President Ramaphosa to South Africans: https://www.sabcnews.com/sabcnews/president-ramaphosa-personally-responsible-gender-violence-action-plan/

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT වුපුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) RESPECT Framework Strengthening the Enabling Environment for VAW Prevention.